ලංකාදීප
# රජරට
2021 නොවැම්බර් මස 14 වැනිදා ඉරිදා

# පළාත් ආයුර්වේද රෝහලේ බෙහෙත් හොරු නිදැල්ලේ

## හොරකම සිදුවෙලා මාස දහයයි

## ලක්ෂ 17ක බෙහෙත් හොරකම් කරලා

(තඹුත්තේගම - සමන් දිසානායක)

**අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ ඖෂධ ගබඩාවේ සිදුව ඇති රුපියල් ලක්ෂ 17කට ආසන්න වටිනාකම් ඇති වියළි ඖෂධ හොරකමට සම්බන්ධ වූවන්ට හොරකම සිදුවී මාස දහයක කාලයක් ගතවුවත් තවමත් ස්ථාන මාරුවක් හෝ ලබාදීමට පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව කටයුතු කර නැතැයි රෝහල් සේවකයෝ පවසති.**

ඖෂධ ගබඩාවෙන් මෙම වියළි ඖෂධ හොරකම සිදුකර ඇත්තේ පසුගිය ජනවාරි මාසයේදී ය. පසුගිය කාලයේ විදේශ රටවලින් වියළි ඖෂධ වර්ග ගෙන්වීම සීමා කර තිබීම නිසා ඒ ඖෂධවල මිල ගණන් අධික ලෙස ඉහළ ගිය අතර එසේ මිල ඉහළ ගිය වියළි ඖෂධ මෙසේ හොරකම් කර තිබේ. ගම්මිරිස්, ඉඟුරු, සාදික්කා, එනසාල්, කහ වැනි වියළි ඖෂධ රෝහලේ ඖෂධ ගබඩාවෙන් මෙසේ හොරකම් කර තිබේ.

ලබාගත් වියළි ඖෂධ ප්‍රමාණය වෛද්‍යවරයා හා ඖෂධ නිෂ්පාදනය කරන නිලධාරියා අනුමත කිරීමෙන් පසුව ඖෂධ නිකුත් කිරීම සඳහා භාවිත කරන ලේඛනයේ සංඛ්‍යා වෙනස් කර වැඩි ප්‍රමාණයක් ලේඛනයේ සටහන් කර මෙම වංචාව කර තිබෙන බව රෝහල් සේවකයෝ කියති.

ඖෂධ හොරකම කර මාස දහයකට වැඩි කාලයක් ගතවී තිබුණත් ඒ සම්බන්ධයෙන් කරන පරීක්ෂණ තවම අවසන් කර නොමැති බව ද රෝහල් සේවකයෝ පවසති.

### බෙහෙත් හොරකම් දැනටත් වෙනවා

**රෝහල් අධ්‍යක්ෂ ප්‍රියානි මල්කාන්ති**

### හොරකම් කළේ වෙනත් කෙනෙක්ද දන්නේ නැහැනේ

**ආයුර්වේද කොමසාරිස් සුපිපි සංඝමිත්තා**

ඖෂධ වංචාව සිදුවූ කාලයේ ගබඩාව භාරව සිටි නිලධාරියා හෝ ඊට සම්බන්ධ කිසිවකු මේ වන තුරුත් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ස්ථාන මාරු කර නොමැති බව පවසන රෝහල් සේවකයෝ මේ හේතුවෙන් කරන පරීක්ෂණවලට එයින් අනිසි බලපෑමක් සිදුවිය හැකි බව ද පෙන්වා දෙති.

**මෙම ඖෂධ වංචාව සම්බන්ධයෙන් ආයුර්වේද රෝහල් අධ්‍යක්ෂ ප්‍රියානි මල්කාන්ති ගොඩගේ මහත්මියගෙන් විමසීමේදී මෙසේ කීවාය.**

"මේ හොරකමට සම්බන්ධ වූ අය පුද්ගලයන් වශයෙන් තවම හඳුනාගෙන නැහැ. පරීක්ෂණ තවම යනවා. පොලිසිය හා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙන වෙනම පරීක්ෂණ කරනවා. වංචාව සිදුවන විට ඖෂධ ගබඩාවේ සිටි ගබඩා භාරකරු රෝහලේම වෙනත් ස්ථානයකට යොමුකරලා තියෙනවා. දැන් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මම නෙවෙයි, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙනුයි. මගෙන් කෙරෙන්න ඕනේ දේ මම කරලා තියෙන්නේ. දැනටත් රෝහලේ බෙහෙත් හොරකම් සිදුවෙනවා. මම ඒ සම්බන්ධයෙනුත් කොමසාරිස්වරිය දැනුවත් කරලයි තියෙන්නේ."

**උතුරුමැද පළාත් ආයුර්වේද කොමසාරිස් සුපිපි සංඝමිත්තා මහත්මියගෙන් මේ පිළිබඳව විමසීමේදී මෙසේ කීවාය.**

"චෝදනාව තවම ඔප්පු වෙලා නැති නිසා ගබඩා භාරකරු රෝහලේම වැඩ කරනවා තමයි. වැඩ තහනම් කරන්න බැ චෝදනාව ඔප්පු වෙනකම්. විමර්ශන කරලා තවම වාර්තාව ආවේ නැහැ. ගබඩාවේ පොත්පත් අපි භාරගෙන තියෙන නිසා පරීක්ෂණවලට බාධාවක් වෙන්නේ නැහැ. මේ හොරකම වෙන කෙනෙක් කරලා ගබඩා භාරකරුගේ ඇගේ ගහන්න හදනවාද දන්නේ නැහැනේ. ඇතුළේ වෙන කෙනෙක්ගේ උදව් නැතිව කාටවත් තනිවම මේ හොරකම කරන්න බැහැ. වාර්තාව ලැබුණු ගමන් එය පොලිසියට ලබාදෙනවා. ඉතිරි ටික පොලිසිය මගින් සිදුකරයි."



## කාබනික ගොවිතැනින් වන හානිවලට වන්දි ගෙවන ක්‍රමය වහාම කියව්..!

### සී කලාපයේ ගොවියෝ උද්ඝෝෂණයේ

රජය මගින් ගොවීන්ට ලබාදෙන බව පැවසූ කාබනික පොහොර කඩිනමින් තමන්ට ලබාදෙන ලෙසත්, පොහොර භාවිතයෙන් වී අස්වැන්න අඩු වුවහොත් ඒ සඳහා වන්දි ලබාදෙන ආකාරය නිරවුල්ව ඉදිරිපත් කරන ලෙසත් රජයට බල කිරීමේ උද්ඝෝෂණයක් මහවැලි සී කලාපයේ ගොවීන් දහසකගේ පමණ සහභාගීත්වයෙන් ඉකුත් 08 ද දෙහිඅත්තකණ්ඩිය නගරයේදී පැවැත්විණි.

මහවැලි සී කලාපයේ ඒකාබද්ධ ගොවි සංවිධානය මගින් මෙම උද්ඝෝෂණය සැලසුම් කර තිබිණි. සී කලාපයේ මහවැලි කොට්ඨාස 07හි ගොවි සංවිධාන 150ක් පමණ නියෝජනය කරමින් ගොවීහු දහසකට අධික සංඛ්‍යාවක් සහභාගී වී සිටි අතර ප්‍රදේශයේ සංඝයා වහන්සේලා කීප නමක් ද එහි වැඩම කර සිටියහ.

දෙහිඅත්තකණ්ඩිය මහවැලි මංසල අසල සිට පා ගමනින් නගර මධ්‍යයේ පිහිටි වටරවුමට පැමිණි උද්ඝෝෂකයෝ කළු කොඩි ඔසවමින් පැය දෙකක පමණ විරෝධතාවයක් එහිදී පැවැත්වූහ.

මහවැලි සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලයට ගොවීන්ගේ ඉල්ලීම් සඳහන් සංදේශයක් භාරදීමෙන් අනතුරුව ගොවියෝ විරෝධතාවය අවසන් කළහ.

(දිඹුලාගල - කුමාර බක්මීදෙණිය)

## එළවළු පලතුරු මිලත් නහුතෙට නැගලා

### සැපයුම 80% කින් පහළ බැහැලා හේතුව රසායනික පොහොර තහනමයි

**තඹුත්තේගම වෙළෙඳ සංගමයේ සභාපති සුනිල්**

(රාජාංගණය - නුවන් කුමාර)

එළවළු හා පලතුරු මිල ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳ සංගමයේ සභාපති සුනිල් සෙනවිරත්න මහතා කියයි.

ඉරිදු ලංකාදීප රජරටට අදහස් දක්වමින් මේ බව කී සෙනවිරත්න මහතා මෙසේද පැවසීය.

"උඩරට හා පහතරට සෑම එළවළු වර්ගයකම මිල ඉතාමත් ඉහළයි. කැකිරි සහ වට්ටක්කා හැර අනෙක් සියලුම එළවළු කිලෝවක තොග මිල රුපියල් 125ට වඩා වැඩියි. වැටකොළු කිලෝවක මිල රුපියල් 190යි, තක්කාලි රුපියල් 300යි, බණ්ඩක්කා රුපියල් 130යි, මැකරල් රුපියල් 200යි, අමුමිරිස් රුපියල් 200 දක්වාත් මාළු මිරිස් 350 දක්වාත් ඉහළ ගිහිල්ලා.

කෝලිකුට්ටු කිලෝවක් රුපියල් 120යි. සීනි කෙසෙල් රුපියල් 65කටත් ඇඹුල් කෙසෙල් රුපියල් 40 දක්වාත් වැඩිවෙලා. මේ තරම් මිල කවදාවත් ඉහළ ගිහිල්ලා නැහැ. වෙළෙඳපොළේ ඉල්ලුමට සරිලන සැපයුමක් නැති නිසා තමයි මේ තරම් මිල වැඩි වෙලා තියෙන්නේ. සාමාන්‍යයෙන් අපේ ආර්ථික මධ්‍යස්ථානයට දවසකට එළවළු කිලෝ ලක්ෂ 10ක් විතර ලැබෙනවා. නමුත් දැන් දවසකට අපිට එන්නේ කිලෝ ලක්ෂ එක හමාරත් දෙකත් අතර ප්‍රමාණයක්. එළවළු ගේන එක 80% කින් අඩුවෙලා. සමහරු කියන්නේ පවතින අයහපත් කාලගුණ තත්වය හින්ද එළවළු ගේන එක අඩුවෙලා කියලා. මම ඒකට කොහොමත් එකඟ නැහැ. මොකද පසුගිය අවුරුදුවලත් කාලගුණය මෙහෙමම තිබුණනේ. ඒත් අපිට ලැබුණු එළවළුවල අඩුවක් වාර්තා වුණේ නැහැ. දැන් ගොවියන්ට එයාලගේ වගාවට යොදන්න රසායනික පොහොර, කෘමිනාශක ගන්න තැනක් නැහැ. මේ හින්ද ගොවියා ගොවිතැනින් ඈත් වෙලා. ගොවිතැන් කරන ගොවියට යොදන්න දේවල් නැති හින්ද එයාලගේ වගාවේ අස්වැන්න අඩුවෙලා. මේ තත්ත්වය දිගටම පැවතුනහොත් පාරිභෝගිකයට හැමදම එළවළු කන්න වෙන්නේ මේ මිලටයි. අනික් පැත්තෙන් ගොවියට සිදුවෙන්නේ වස බොන්න. මේ පාර්ශ්ව දෙකම නැතිවෙනකොට ව්‍යාපාරිකයත් නැත්තටම නැතිවෙනවා." යි ද සෙනවිරත්න මහතා කීවේය.

**වනජීවී නිලධාරියකුට පහර දීමේ සිද්ධිය:**

## යුද හමුදා මේජර් ජනරාල්වරයාට එරෙහි නඩුව අප්‍රේල් 21 යළි කැඳවයි

(අනුරාධපුර අධිකරණ උපාලි ආනන්ද)

මින්නේරිය ජාතික වනෝද්‍යානයේ රාජකාරියෙහි යෙදී සිටි වනජීවී නිලධාරීන්ගේ රාජකාරියට බාධා කර එක් වනජීවී නිලධාරියකුට පහර දුන් බවට යුද හමුදාවේ මේජර් ජනරාල්වරයකුට එරෙහිව පවතින නඩුව 2022 අප්‍රේල් 21 වැනිද යළි කැඳවීමට කැකිරාව දිසා විනිසුරු සහ මහේස්ත්‍රාත් සමන් වැරණියගොඩ මහතා නියෝග කළේය.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණය හමුවේ චෝදනා ලබා සිටින්නේ ශ්‍රී ලංකා යුද හමුදාවේ 21 වැනි සේනාංකාධිපති මේජර් ජනරාල් මොහාන් රත්නායක මහතායි.

වනජීවී දෙපාර්තමේන්තුව මගින් සැකකාර මේජර් ජනරාල්වරයාට එරෙහිව කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පවරා ඇති මෙම නඩුවට අතර මැදි පාර්ශ්වයක් ලෙස ආචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝභිත හිමියන් සභාපතිත්වය හොබවන සතුන්ට සහ ස්වභාව ධර්මයට යුක්තිය උදෙසා සංවිධානය මැදිහත්ව සිටියි. ඒ සංවිධානය වෙනුවෙන් අධිකරණයට කරුණු දක්වන්නේ නීතිඥවරුන් වන අනුරුද්ධ විජේරත්න මහතා සමඟ නීතිඥ ගැමුණු දිසානායක මහතා සහ නීතිඥ වින්ද්‍යා නිශ්ශංක මහත්මියයි.

මෙම නඩුව අවසන් වරට විවෘත අධිකරණය හමුවේ කැඳවූ අවස්ථාවේ පැමිණිලිකාර වනජීවී දෙපාර්තමේන්තුව වෙනුවෙන් අධිකරණයට කරුණු දක්වමින් අඩවි ආරක්ෂක නීතිඥ ඒ. පී. කේ. ආරියරත්න මහතා සඳහන් කළේ මෙම සිද්ධිය සම්බන්ධයෙන් කෙරෙන විමර්ශනයට ප්‍රකාශයක් ලබා දෙන ලෙසට සැකකාර මේජර් ජනරාල්වරයාට නිල වශයෙන් දැනුම් දුන්න ද එම දැනුම් දීමට අනුව ඔහු පැමිණ ප්‍රකාශයක් ලබා දීම පැහැර හරිමින් සිටින බවය.

නීතිඥ ආරියරත්න මහතාගේ කරුණු දැක්වීම් සැලකිල්ලට ගත් මහේස්ත්‍රාත් සමන් වැරණියගොඩ මහතා සැකකාර මේජර් ජනරල්වරයාට නියෝග කළේ අධිකරණය හමුවේ පෙනී සිටින ලෙසය.

සැකකාර මේජර් ජනරාල්වරයාට එරෙහිව වනජීවී දෙපාර්ත මේන්තුව මගින් කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පවරා ඇති මෙම නඩුවට අමතරව ඔහුට එරෙහිව හබරණ පොලිසිය මගින් කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පවරා ඇති තවත් නඩුවක් ද විභාග වෙමින් පවතී.

## තඹුත්තේගම ඩෙංගුත් නගියි

(රාජාංගණය-නුවන් කුමාර)

**පසුගිය සති දෙකක කාලය තුළ තඹුත්තේගම කොට්ඨාසයෙන් ඩෙංගු රෝගීන් වාර්තාවීමේ ප්‍රවණතාව ඉහළ ගොස් ඇතැයි තඹුත්තේගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක බුද්ධික මල්ලවාරච්චි මහතා පවසයි.**

ඩෙංගු රෝගීන් ඉහළ යෑම පිළිබඳව අදහස් දක්වමින් මේ බව පැවසූ මල්ලවාරච්චි මහතා මෙසේද කියයි.

පසුගිය මාස කිහිපයේ මේ ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් වාර්තා වුණේ අඩුවෙන්. නමුත් දැනට සති දෙකක කාලයක සිට ඩෙංගු රෝගීන් වැඩියෙන් වාර්තා වෙන්න පටන්ගෙන තියෙනවා. වැඩිපුර ඩෙංගු රෝගීන් ඉන්නේ බස්නාහිර පළාතේ. මෙහෙට පදිංචි බොහෝ පිරිසක් රැකියා කරන්නේ එහෙ. පළාත් සංචරණ සීමා ඉවත් කළාට පස්සේ බස්නාහිර පළාතෙන් මෙහෙට එන පිරිස වැඩිවුණා. ඒක තමයි මේ රෝගය වැඩිවීමට හේතුව.මේ රෝගය වැළදෙන්න වාහකයෙක්, වෛරසය හා නිරෝගී පුද්ගලයෙක් කියන අවශ්‍යතා තුනම එකට එක්වෙන්න අවශ්‍යයි. පසුගිය කාලේ. වාහකයෙක් හිටියත් වෛරසය තිබුණේ නැහැ. දැන් වෛරසය තියෙනවා.

ඉදිරි දින දින කිහිපයක තුළ ඩෙංගු වැඩිවෙන්න පුළුවන්. පසුගිය කාලේ අපිට වැඩියෙන්ම ඩෙංගු මදුරු කීටයන් හමුවුණේ තඹුත්තේගම නගරයේ පුද්ගලික ආයතනවලිනුයි රාජ්‍ය ආයතනවලිනුයි.

මේ දිනවල වර්ෂාව හින්ද බොහෝ පිරිසක් භාජනවලට වැහි වතුර පුරවනවා. වතුර පිරුණට පස්සේ ඒවා හළලා දනවා.එතකොට මදුරු කීටයන් බිත්තිවල ඇළවෙනවා. ඒවා ලේහෙසියෙන් ගැළවෙන්නේ නැහැ. හැම වේලාවේම වර්ෂා සමයේදි බිත්ති නිසිපරිදි පිරිසිදු කළයුතුමයි.

මේ දිනවල කොරෝනා වසංගතය ව්‍යාප්ත වෙන හින්ද සෞඛ්‍ය අංශවල නිලධාරීන්ට ඒ රෝගය පැත්තට අවධානය යොමු කරන්න සිදුවෙලා. ඒ හින්ද නිතරම ඩෙංගු රෝගය පිළිබඳව හොයා බලන්න අපහසුයි.මහජනතාවගේ වගකීම තමයි තමන්ගේ ආරක්ෂාව සලසාගන්න ගන්න එක. එහෙම නැතිවුණොත් අයහපත් ප්‍රතිඵලවලට අපිට මුහුණ දෙන්න සිදුවෙනවා'යිද හෙතෙම අවධාරණය කළේය.

## පොළොන්නරුවේ ගොවියෝ වී වගාවට පොල් පොහොර යොදන්න සැරසෙත්

(දිඹුලාගල කුමාර බක්මීදෙණිය)

පොළොන්නරුවේ සහ මහවැලි බී හා සී කලාපවල ගොවීහු විශාල පිරිසක් රසායනික පොහොර වලට විකල්පයක් ලෙස මෙවර මහ කන්නයේදී වී වගාවට පොල් පොහොර යෙදවීමට සූදානම්ව සිටින බවත්, ඒ පොහොර වී වගාවට යෙදවීම කෘෂිකර්ම නිලධාරීන් හා පොල් සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් නිර්දේශ නොකරන බවත් ප්‍රදේශයේ ගොවි නියෝජිතයෝ කියති.

සී කලාපයේ ගොවි සංවිධාන නියෝජිතයෝ කීපදෙනෙක් මෙසේද කීහ.

"මේ කන්නයේ රසායනික පොහොර හිග වීමත් සමග ගොවියෝ දැඩි කනස්සල්ලෙන් ඉන්නේ.ඒ අයට කාබනික පොහොර ගැන කිසිම විශ්වාසයක් නැ. මේ නිසා පොළොන්නරුවේ සහ මහවැලි බී,සී කලාපවල ගොවියෝ බොහෝ දෙනෙක් මෙවර කුඹුරුවලට පොල් පොහොර යොදන්න සූදානමින් ඉන්නවා.නමුත් කෘෂිකර්ම නිලධාරීන් හා පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිලධාරීන් මේ පොහොර කුඹුරු වලට යොදන්න එපා කියනවා."

"මේ වන විටත් බොහෝ ගොවියෝ වෙළෙන්දන්ගෙන් පොල් පොහොර මිලදීගෙන ගෙවල්වල තියාගෙන ඉන්නවා. ඇතැම් වෙළෙන්දෝ මේක ජාවාරමක් කරගෙන ගොවියන් සූරා කනවා. කිලෝ 50 පොල් පොහොර මල්ලක් රැපියල් 3,000ත් 4,000ත් අතර විවිධ මිල ගනන් වලට විකුණනවා. මේවා ගැන හොයන්න බලන්න කව්රුවත් නැ."

### ගොයමට හානි වෙනවා මෝඩ වැඩේ කරන්න එපා

**දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ උපාලි**

**මේ පිළිබඳව පොළොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ ආර්.පී උපාලි මහතාගෙන් කළ විමසීමේදී මෙසේ කීය.**

"පොල් පොහොර වී වගාවට නිර්දේශ කරලා නෑ. මේක දීර්ඝ කාලීන පොහොර වර්ගයක්. පොල් වගාවට යෙදුවාම කාලයක් තිස්සේ අවශ්‍ය පෝෂණ කොටස් ක්‍රමක් ක්‍රමයෙන් ගසට ලබා ගන්නවා."

"මේ පොහොරවල පොස්පේට්, ඩොලමයිට් හා මුහුදු වැලි අඩංගුයි. ගොයමට අවශ්‍ය පොෂණය මේවාගෙන් දෙන්න බෑ. ගොයමට හානි සිදුවෙනවා. ගොවීන්ට මම කියනවා පොල් පොහොර ගොයමට යොදන්න එපා කියලා."

**පොල් වගා කිරීමේ මණ්ඩලයේ පොළොන්නරුව ප්‍රාදේශිය කළමනාකාර සමන් හේරත් මහතා මෙසේ කියයි.**

"පොල් පොහොර වී වගාවට නිර්දේශ කරලා නෑ.මීට වසර කීපයකට කලින් ගොවියෝ පොල් පොහොර වී වගාවට යොදන්න පටන් ගත්තා. ඒ අවස්ථාවේ අපි ඒ ගොවීයෝ හමුවෙලා ඔවුන් දැනුවත් කරලා ගොයමට පොල් පොහොර භාවිතා කරන එක නතර කළා.

ඔය විදිහට වෙළෙඳ පොළෙන් පොල් පොහොර ගන්න අපි පොල් පොහොර නිකුත් කරන්නේ නෑ. ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා පොල් ගොවීන්ගේ අවශ්‍යතා අනුව පමණක් සහනදායි මිලට ලබාදෙනවා. සමහරවිට ඔය පොහොර ව්‍යාජ ඒවා වෙන්න පුළුවන්. නැතිනම් වෙනත් සමාගම් වලින් නිෂ්පාදනය කළ ඒවා වෙන්න පුළුවන්. සාම්පල් පරීක්ෂා කෙරුවොත් මේ ගැන හරියටම කියන්න පුළුවනි. ඒ පිළිබඳ ඉදිරියේදී සොයාබලා කටයුතු කරනවායි සමන් මහතා කියයි.

## ලක්ෂ 6 ක් වටිනා ඔක්සි මීටර් 250 ක් රාජසන්තක කරයි

### අධිකරණයෙන් දඬුවම් ලැබූ බව සඳහන් කරමින් පුවත්පත් දැන්වීම් පළ කරන ලෙසත් නියෝග

(අනුරාධපුර අධිකරණ උපාලි ආනන්ද)

රුපියල් ලක්ෂ 6 ක් පමණ වටිනා ලියාපදිංචි නොකළ ඔක්සි මීටර් 250 ක් රාජ සන්තක කර ඖෂධ නියාමන අධිකාරියට බාර දෙන ලෙස අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත් හේමන්ත පුෂ්ප කුමාර මහතා නියෝග කරයි.

විත්තිකරුට මුදලින් රුපියල් 15,000ක දඩයක්ද නියම කළ අතිරේක මහේස්ත්‍රාත්වරයා තමන් මෙම වරද කිරීම හේතුවෙන් අධිකරණයෙන් වරදකරු වී දඬුවම් ලැබූ බව සඳහන් කරමින් ජාතික පුවත්පත්වල දැන්වීම් පළකර ඒ පිළිබඳව ප්‍රසිද්ධියට පත් කරන ලෙසටද විත්තිකරුට නියෝග කළේය.

පුවත්පත් දැන්වීම් පළ කර ඒ පුවත්පත් දැන්වීම් ලබන දෙසැම්බර් 10 වැනිද අධිකරණය හමුවට ඉදිරිපත් කරන ලෙසටද විත්තිකරුට තවදුටරත් නියෝග කළ මහේස්ත්‍රාත්වරයා එතෙක් විත්තිකරු රුපියල් ලක්ෂයක ශරීර ඇපයක් මත මුදා හැරීමට ද නියෝග කළේය.

මෙසේ දඬුවම් නියම වූයේ පොල්ගස්ඕවිට සියඹලාගොඩ පදිංචිකරුවකු වන ඩබ්. එම්. විජේරත්න යන අයටයි. අනුරාධපුර උලුක්කුලම පොලිස් විශේෂ කාර්ය බළකා කඳවුරේ නිලධාරීන්ගේ සහය ඇතිව අනුරාධපුර දිස්ත්‍රික් ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන් වන ආනන්ද වේරගෙඩ සහ ප්‍රසාද් උදය කුමාර යන මහත්වරුන් මෙම වැටළීම කර තිබිණි. ඒ උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය පාලිත බණ්ඩාර සහ අනුරාධපරු ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය එන්.සී.ඩී. ආරියරත්න යන මහත්වරුන්ගේ උපදෙස් මතය

පැමිණිල්ල වෙනුවෙන් අනුරාධපුර දිස්ත්‍රික් ආහාර හා ඖෂධ පරීක්ෂක ආනන්ද වේරගොඩ මහතා පෙනී සිටි අතර විත්තිකරු වෙනුවෙන් නීතිඥ සුසිල් සිරිවර්ධන මහතා පෙනී සිටියේය.

# සඟ රුවන නොමඟයාමේ ආදීනව

**“සැදැහැත්තන් රවටා කුස පුරවනවාට වඩා ගෙරින් කපන කැත්තෙන් බඩ පලාගැනීම යෙහෙකි”යි සද්ධම්මෝපායනයෙහි සඳහන් වෙයි.**

**මෙම ලිපිය කිසිසේත් භික්ෂූන් වහන්සේලා විවේචනය කිරීමක් නොව භික්ෂුත්වයට හානි කරන භික්ෂු ප්‍රතිරූපකයන් ඉන් මුදා ගැනීම අරමුණු කර ගත්තකි. එසේ නොවුවහොත් අනාගතයේ මෙරට බුදු සසුන කුමන තත්ත්වයකට පත්වේදැයි සිතීම පවා අපහසු විය හැකිය. මීට පෙර වෙනත් පුවත්පතක පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයකු විසින් මේ තත්ත්වය පෙන්වා දීමේ ලිපියක් පළකර තිබිණි.**

විජය කුමරු සහ පිරිස මෙරටට පැමිණෙන අවස්ථාවේ බුදුන් වහන්සේ ශක්‍ර දෙවියන් අමතා ඒ පිරිස ආරක්ෂා කළ යුතු බව පවසා ඇත්තේ අනාගතයේ පිරිසිදු බුදු සසුන රැකෙන ස්ථානය සිරිලක බව පෙන්වමිනි. බුදුන් වහන්සේගේ මෙම අපේක්ෂාව සාක්ෂාත් කරගැනීමට භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසම කැපවිය යුතුය.

බුදු සමයේ සමාරම්භයේදී භික්ෂූන් වහන්සේලා ගිහි සැප හැරදමා හිස මුඩුකොට පැවිදි ජීවිතයට එළඹුණේ නැවත ගිහි සැප සෙවීමට නොවේ. එහෙත් එකල ද සවැගි මහණුන් යනුවෙන් හැඳින්වූ ඉතාමත් අල්ප භික්ෂූ පිරිසක් සඟ විනය කඩකරමින් හැසිරීම හා බුදුන් වහන්සේ මේ පිරිසට කරන ලද අවවාදනුශාසනා ගැන විනය පොත්වල සඳහන්ය.

කාලයාගේ ඇවෑමෙන් දයක කාරකාදීන් සඟ සසුනට පූජාකරන ලද ඉඩකඩම් හා ධනය නිසා භික්ෂූවගේ දිවි පෙවෙතෙහි යම් වෙනසක් ඇති වුවද පුරාණයේ උන්වහන්සේලා ධනය ඉපයීමේ කටයුතුවල නියැළී සිටි බවකට හෝ දයකයින් දුන් ධනය පෞද්ගලික සුඛවිහරණයට භාවිත කළ බවකට හෝ එතරම් සාක්ෂි හමුවන්නේ නැත.

එහෙයින්ම බෞද්ධ සැදැහැතියන් තුළ උන්වහන්සේලා කෙරෙහි ගරුත්වයක් පැවතුණි. එහෙත් ඉහත කී අයුරින් ඉතා සුළුතරයක් භික්ෂූන් බුදුන් වහන්සේගේ සාසනයේ පැවිදි වීමේ මූලික අරමුණ පසෙක ලා අඹුදරුවන් පෝෂණය කිරීම ගැන දක්වමින් එවැන්නන්ට ආරාමයේ විසීමට ඉඩ නොදිය යුතු බව ක්‍රිස්තු වර්ෂ 9 වන සියවසට අයත් අනුරාධපුර අභයගිරි කපාරාරාම ශිලා ලිපියේ සඳහන් වෙයි.

පුරාණයේ මෙසේ යම් යම් භික්ෂූ ප්‍රතිරූපකයන් දහම පසෙක ලා ලෞකික ගිහි සැපත පැතීමට විරුද්ධ වූ බහුශ්‍රැත වූ විනයකාමී වූ භික්ෂූන් වහන්සේලා ඒ පිරිසට අවවාද වශයෙන් ලියූ ග්‍රන්ථ දක්නට ඇත. පොළොන්නරු යුගයේදී රචනා වූ අභයගිරි කවි චක්‍රවර්තී හිමිගේ සද්ධම්මෝපායනී නම් ග්‍රන්ථයේ එවැනි භික්ෂූ ප්‍රතිරූපකයින් ගැන සඳහන්ය. එහි සඳහන් කරුණු අතරින් කීපයක් මෙසේය.

තමාට නැති සීල ගුණයක් චාටුවට පෙන්වමින් මුහුණ බිමට හරවා සෙමින් ගමන් කරමින් සැදැහැවතුන් රවටන්නෝ නළුවන් හා සමානය. එසේ සැදැහැත්තන් රවටා කුස පුරවනවාට වඩා ගෙරින් කපන කැත්තෙන් බඩ පලාගැනීම යෙහෙකි. යනාදී වශයෙනි.

පහසුවෙන් කම්සැප විඳීම අපේක්ෂාවෙන් සසුනට ඇතුළු වී සිටින ශ්‍රමණ ප්‍රතිරූපකයන් විනයේ හඳුන්වා ඇත්තේ අලජ්ජීන් හෙවත් ලජ්ජා නැත්තන් ලෙසය. මෙවැනි ප්‍රතිරූපකයන්ගෙන් සසුනට සිදුවන විනාශය දැක කම්පා වූ පොළොන්නරු යුගයේ මහ පැරකුම්බා රජතුමා දිඹුලාගල අරණ්‍යවාසී මහා කාශ්‍යප මහතෙරනුවන් ප්‍රමුඛ කොටගත් ශීලවන්ත බහුශ්‍රැත භික්ෂූන් ලවා ලක්දිව පුරා විසිරී සිටි එවැනි ශ්‍රමණ ප්‍රතිරූපකයින් සිවුරු හරවා ශාසනය පිරිසිදු කිරීමේ පුවත පොළොන්නරු ගල් විහාර ශිලා ලිපියේ සඳහන් වෙයි.

වරින්වර සංඝායනා ඇතිවන්නේත් විනය නීති සඳහන් කතිකාවත් ඇති වූයේත් සසුන කෙලෙසන මෙවැනි ශ්‍රමණ ප්‍රතිරූපකයින්ගෙන් සසුන රැකගැනීමටය. එහෙත් වරින් වර ඒ තත්ත්වය නැවත නැවත මතුවී ආ බව පෙනෙනුයේ 18 වැනි සියවසේදී මුංකොටුවේ රාළ විසින් රචිත සඟරජවත කෘතියේ අඩංගු කරුණුවලිනි. එහි සඳහන් විස්තරවලින් සංක්ෂිප්තයක් මෙසේය.

සැදැහැත්තන් පුදන - නොයෙක් පූජා ලබමින
නෑයන්ට බෙදමින - නිමල සස්නේ කසළ තවරන
දහම් ලෙස නොහැසිර - කුල දූෂණය කර කර
බණ නොඋගෙන පවර - නැකත් වෙදකම් පුරුදු කර කර
එයින් ලොව සිත්ගෙන - වස්තුව උපදවාගෙන
අඹු දරුවන් රකින - පමණමැයි උන් රකින සිල්ගුණ

**“වැන්දඹු ස්ත්‍රීන් වෙසෙන ගෙවල්වල නිදති. බොරු සාක්කි කියති. මොවුහු හොර කාසි ආදියෙන් ලෝකයා රවටා සොරුන් මෙන් හැසිරෙති”යි වගේගොඩ සංදේශයෙහි සඳහන් වෙයි.**

**බහුශ්‍රැත වූ විනයකාමී වූ ගණනායක භික්ෂූන් වහන්සේලා මුනිවත නොරැක මේ තත්ත්වය වෙනස් කිරීමට අප්‍රමාදව කටයුතු කළ යුතු කාලය එළැඹ ඇත.**



සම්මානිත මහාචාර්ය
**ටී.ජී. කුලතුංග**

18 වැනි සියවසේ උඩරට විසූ රොබට් නොක්ස් ද සමහර භික්ෂු ප්‍රතිරූපකයින් විසින් ගිහියන් රවටමින් ධනය උපයන ආකාරය පිළිබඳ රසවත් කතා පුවත් ඉදිරිපත් කර ඇත. ඉන් එකක් වනුයේ මළ ගෙදරක රාත්‍රී නවාතැන් ගන්නා පැවිද්ද රාත්‍රියේ මළගිය ප්‍රාණකාරය තමාට සිහිනෙන් පෙනී අසුවල් අසුවල් භාණ්ඩ හෝ ඉඩකඩම් පන්සලට පූජා කරන්නට කී බව පවසා ඒවා ලබාගැනීමය.

කීර්ති ශ්‍රී රාජසිංහ අවධියේ පහතරට භික්ෂුවක් විසින් සරණංකර සංඝ රාජයන් වහන්සේ වෙත යැවූ වගේගොඩ සංදේශයේ ද මේ තත්ත්වය මැනවින් විස්තර කර තිබේ. ‘ලජ්ජාවක් නැති මොවුන් ලන්දේසීන්ට මුදල් දී අනුන්ට අයත් වැව් හා කුඹුරු අයිති කරගෙන ගොවිතැන් කොට සිය නෑයින් පෝෂණය කරති. තමන්ගේ සීල ගුණය බිඳින්නවුන් මෙන් වනයේ ගස් බිඳ දමා ගිනි තබා උඳු මුං වපුරා අඹු දරුවන් පෝෂණය කරති. දිවා රෑ දෙකෙහි හරක් රැකීමද මුදල් පොලියට දීමද වෙළඳාම්ද කරති.

ධර්මයෙන් හීන වූ මොවුන් තම බාල සහෝදරයින්ට දීමට යැයි කියා කුලස්ත්‍රීන් පොළඹවා ගෙන එති. නුවණැත්තන් විසින් නින්ද කරන මොවුහු ගෙයක් පාසා මුදල් හිඟමනේ යති. සිතින්වත් ධර්මය ගැන නොසිතත් පවිටු අධර්මවාදී මොවුනට ව්‍යාකරණය වැදගත් නොවේ. සහල්ම වැදගත් වේ. පවට බියක් නැති මොවුහු වාදනය කරති. ගී කියති. වැන්දඹු ස්ත්‍රීන් වෙසෙන ගෙවල්වල නිදති. බොරු සාක්කි කියති. මොවුහු හොර කාසි ආදියෙන් ලෝකයා රවටා සොරුන් මෙන් හැසිරෙති.’


බණ පොතේ සඳහන් පරිදි පන්දහසක් කල් බුදු සමය රැකෙන්නට නම් වර්තමානයේ වුවද අතීතයේ පැවැති මේ තත්ත්වයන්ද සැලකිල්ලට ගත යුතුව ඇත. දෛනිකව ගිහි පැවිදි සමාජයේ අසන්නට ලැබෙන සමාජ විරෝධී ක්‍රියාවන්ට පසුබිම වන්නේ සිත දහමට නැඹුරු නොවීමය. සිත සන්සුන් නොවීමය. සිත තැන්පත් නොවීමය. වෛරී අදහස්වලින් යුක්තව ක්‍රියා කිරීමය.

වර්තමානයේද භික්ෂුත්වයට නොගැලපෙන ක්‍රියාවේ යුක්ත කාමභෝගී ගිහියන් මෙන් හැසිරෙන භික්ෂු ප්‍රතිරූපකයන් නිසා විනයගරුක සිල්වත් භික්ෂූන්ටද ගැටලුවකි. බුද්ධිමත් සැදැහැවතුන්ගේ කළකිරීමටද හේතුවෙයි. විභාග සඳහා බුද්ධ ධර්මය ටියුෂන් දෙන හිමිවරුන්ගේ පෝස්ටර් ය. ගිහියන් සමඟ නඩුහබවලට යන්නවුන්ද වෙති. භික්ෂූත්වයට නොගැලපෙන රජයේ රැකියා කරන්නවුන්ද වෙති. බහුශ්‍රැත වූ විනයකාමී වූ ගණනායක භික්ෂූන් වහන්සේලා මුනිවත නොරැක මේ තත්වය වෙනස් කිරීමට අප්‍රමාදව කටයුතු කළ යුතු කාලය එළැඹ ඇත.

---

## ලූ.. ලූ.. ලූ...

### දූෂිත අම්මණ්ඩියෙක් ලොකු පුටුවකට කෙළ හලයි



ඉන්නේ ප්‍රධාන නගරයකට දුරින්ලු. බලවතියක්ලු. එහෙම වුණේ තවත් බලවතෙක් හින්දලු. වල්ලඹයා තනතුරක් දැරුවත් ඒක නෝනාට පහළ එකක්ලු. පොඩි උන්ට අකුරු කියාදෙන තැන්වල ලොකු තැන් යන මීටින්වලට රිංගන්නේ බලෙන්ලු.

ලොකු නෝනා ලොකු පුටුවකට මුලින්ම ගියේ කැළැවක් තියෙන පැත්තකලු. ඒ කාලේ සුදුසුකම් නැතත්, එතනට යැව්වේ හිටිය ප්‍රබලයෙක්ලු. එයාට පොඩි පොඩි සන්තෝසම් දුන්නා කියලත් තැන් තැන්වල කසු කුසුවලු. එහෙදි කේස් එකක් ආවාලු. පනිෂ්මන්ට් ට්‍රාන්සරයක් දුන්නාලු. ඒක ගව් ගාණක් දුරකටලු. ආපහු ප්‍රධාන පෙළේ පැත්තටකට පැන්නාලු. උදව් කළේ දැන් ඒ පැත්තේ ඉන්න බලවතෙක්ලු. ඒ හින්දම එයා කියන කියන දේ කරනවාලු. පුදුම කඩේ යෑමක්ලු. පැත්තට වෙන සේවයක් නැතිලු.

පහුගිය දෙහේ තමන් යටතේ ඉන්න උදවියට ලොකු බලපෑම්ලු. නාද වෙන එකෙන් වගේම මුලිච්චි වුණාමත් ඒ විදිහට බැනුම්ලු. වැදගත් තැන් ළඟදි පටන් ගන්නවා කියලා කිව්වාලු. තමන්ට දුන්න රෝද හතරෙන්ම ගිහින් බැනර් දැම්මාලු. දැන් පුදුම කලස්ලු. එහෙම වෙන්නේ පැත්තම හොල්ලන ලොකු පුටුවක් බලාගෙනලු. ඉන්න ලොකු තැන ළඟදි ගෙදර යනවාලු. හිටපු තැන යා යුත්තේ නම් මහ උළු ගෙදරටලු. එහෙම නොවුණේ එයත් ඉහළින්ම කඩේ ගිය හින්දලු. හිටපු සේරම පැත්තම කාපු අයලු. එහෙම වුණේ මහ උන්ට කඩේ ගිය හින්දලු. අලුත් නෝනා ආවත් අටෙන් නවයට වැටෙන එක ෂුවර්ම ෂුවර් කියලා තැන් තැන්වල කතාවලු.

### කළගුණ නොදත් එකාගේ උද්ඝෝෂණයට තිස් දෙනයි




මනාප සටනක් ළඟදීම එනවා කියලා කසු කුසුවක්ලු. පහුගිය මහ සටනින් පල්ලම් බැස්ස උදවිය කඩි ගුලක් වගේ ඇවිස්සිලාලු. ලොකු පුටුවට තුන් කොන් සටනක්ලු. ඒ අතරින් හිටපු ලොකු තැනක් සටනට බැහැලලු. නැති නෑකම් කියාගෙන ගම්වලට එනවාලු.

පහුගිය කාලේ තමන්ගේ උන් කෑවද බීවද කියලාවත් හෙව්වේ නැතිලු. බලේ තිබුණු වංගියේ රැකියා ටිකත් වික්කේ කාසිවලටලු. පොඩි එකාට බෙදන්ට ගෙනාපු කකුල් හතරේ එවුනුත් ගත්තේ තමන්ටලු. ළඟදි දවසක පුංචි පහේ මීටින් තියාගෙන ගම් ගානේ ගියාලු. දැන් මොකද හිටපු ගමන් නැති කැක්කුමක් කියලා කටකාර හාදයෝ ඇහැව්වාලු. දැන් පොඩි එකාට වැලේ වැල් නැති හින්ද ආණ්ඩුවට රිදෙන දෙයක් කොරන්ට වෙනවා කිව්වාලු. ගමකින් දහය ගානේ ගෙනත් හන්දියක මහ උන්ට දැනෙන දෙයක් කොරමු කිව්වාලු.


වැඩේ තිබුණු දවසේ හිටියේ හරියටම දහයේ ඒවා තුනයිලු. ඊට වඩා කාකි සූට් ඇඳ ගත්ත හාදයොයි රිපෝටර් මලයලයි හිටියාලු. ලොකු තැනට මේක ආරංචි වුණාලු. මට වැඩක් තියෙන හින්ද අද ඔය පැත්තේ එන්න බැහැ කිව්වාලු. මෙයා යන යන තැන එහෙමලු. ගම් ගානේ මේ හාදයට කඩේ යන උන්ට පතුරු යනකල් අමතනවාලු. මෙද පාර අපි වෙන පැත්තක් බලනවා කිව්වාලු. එයාගේ නම ගැනත් කිව්වාලු. සර්, එන පොට හොඳ නැහැ කියලා ගෝලයෝ කිව්වාලු. වපුරපු හැටියට තමයි අස්වනු කියලත් කිව්වාලු. ලොකු තැන දැන් ඉන්නේ දෙගිඩියාවෙන්ලු.

### ධර්ම චක්කරේ ගහගත් හරකා ගැබ්බර එළදෙනට වතුරවත් දීලා නෑ



ප්‍රසිද්ධ පැත්තක [illegible]

### දඹුලු ගිහින් තළගොයි මරණ මිනිහා අලුත් ලොක්කටත් බෝලේ බස්සලා



[illegible]

කිරලා


---

### සුසාන භූමියක රථ ගාලක් ඉදිකිරීම:

### තලාව සභාපතිට එරෙහි නඩුව නොවැම්බර් 25 යළිත් විභාගයට

(අනුරාධපුර අධිකරණ උපාලි ආනන්ද)

ගම්මාන තුනක ජීවත්ව මිය යන ඉස්ලාම් භක්තිකයින්ගේ මළ සිරුරු භූමදානය කිරීමට නීත්‍යානුකූලව වෙන් කර ඇති පොදු සුසාන භූමියක රථ ගාලක් ඉදිකිරීමට තලාව ප්‍රාදේශීය සභාව ගෙන ඇති තීරණයක් අභියෝගයට ලක් කරමින් ඒ තීරණය බල රහිත කරන ලෙස ඉල්ලා මහාධිකරණයට ඉදිරිපත් කර ඇති පෙත්සම නොවැම්බර් 25 වැනිද විභාගයට ගැනීමට උතුරු මැද පළාත් බද මහාධිකරණ විනිසුරු මනෝජ් තල්ගොඩපිටිය මහතා නියෝග කරයි.




ඒ මෙම නඩුවට අදාළව පෙත්සම්කාර සහ පැමිණිලිකාර පාර්ශ්වයන් නියෝජනය කරමින් නීතිඥයින් අධිකරණයට කළ කරුණු දැක්වීම් සැලකිල්ලට ගිනිමිනි. මෙමෙ පෙත්සම විභාග කර අවසන් තීන්දුවක් ලබා දෙන තුරු ප්‍රශ්න ගත සුසාන භූමියෙහි කිසිදු ඉදිකිරීමක් නොකරන ලෙසට තලාව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට මහාධිකරණ විනිසුරුවරයා මීට පෙර නියෝග කළේය.

එමෙන්ම මෙම සුසාන භූමිය ඉස්ලාම් භක්තිකයින්ගේ මළ සිරුරු භූමදානය කිරීමට හැර වෙනත් කිසිදු කටයුත්තකට යොදා නොගන්නා ලෙසටද වගඋත්තරකාර ප්‍රාදේශීය සභා සභාපතිවරයාට එදින තවදුරටත් නියෝග කළ මහාධිකරණ විනිසුරුවරයා අදාළ සුසාන භූමියෙහි මළ සිරුරු භූමදානය කිරීමට බාධා නොකරන ලෙසටද නියෝග කළේය. මෙමෙ අධිකරණ නියෝග කඩ කළහොත් අධිකරණයට අපහාස කළා සේ සලකා නීතිමය පියවර ගන්නා බවටද මහාධිකරණ විනිසුරුවරයා වගඋත්තරකාර ප්‍රාදේශීය සභා සභාපතිවරයාට තවදුරටත් දැන්වීය.

එප්පාවල, තලාව පාර පොලිසිය හන්දිය පදිංචි ජෙයිනූල් ආබ්දීන්, එප්පාවල 16 කණුව පදිංචි මොහොමඩ් හෆීල්, එප්පාවල ඇඳගල පදිංචිකරුවන් වන මොහොමඩ් කන්නූ ෆාරුක් සහ මොහොමඩ් සතාර් සහ මහඉලුප්පල්ලම ගල්මඩුව පදිංචිකරුවන් වන මුම්මු ජසිතා සහ සින්නි ෆාරීද යන මහත්ම මහත්මීන් නීතිඥ බුද්ධික ලෙව්කේ බණ්ඩාර මහතා මගින් අනුරාධපුර මහාධිකරණයට මෙමෙ පෙත්සම ගොනු කොට ඇත

මෙමෙ නඩුවේ වගඋත්තරකරුවන් ලෙස නම් කර සිටින්නේ තලාව ප්‍රාදේශීය සභාවේ සභාපති ටී.එම්. ඉන්දික උයඳ කුමාර තෙන්නකෝන් සහ උතුරු මැද පළාත් පාලන කොමසාරිස් රෝයි නිශාන්ත යන මහත්වරුන් සහ තලාව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සහ තලාව ප්‍රාදේශීය සභාවයි. පෙත්සම්කරුවන් වෙනුවෙන් නීතිඥ බුද්ධික ලෙව්කේ බණ්ඩාර මහතා පෙනී සිටින අතර වගඋත්තරකරුවන් වෙනුවෙන් නීතිඥ මහේෂ් කොටුවැල්ල මහතා පෙනී සිටියි.

## ඕස්ට්‍රේලියාවේ ලාංකිකයකුගෙන් දිඹුලාගල දිළිඳු පවුල් 200ට වියළි ආහාර මලු



දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 20ක දිළිඳු පවුල් 200ක් සඳහා රුපියල් ලක්ෂ 04ක් පමණ වටිනා වියළි ආහාර මලු 200 ක් බෙදා දීමේ වැඩසටහනක් පසුගිය ද එම වසම් වලදී සිදු කෙරුණි.

ඕස්ට්‍රේලියාවේ පදිංචි ශ්‍රී ලාංකිකයකුගේ පරිත්‍යාගයක් මත පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා මෙම වියළි ආහාර මලු තොගය දිඹුලාගලට ලැබුණු බව එහි සමාජ සේවා නිලධාරිනී උෂානි වීරසිංහ මහත්මිය පැවසුවාය.

දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් ජී.ටී.එම්. ඉර්ෆාන් මහතාගේ උපදෙස් පරිදි එහි පරිපාලන ග්‍රාමනිලධාරි එස්.එම්. අබේරත්න, සමාජසේවා නිලධාරිනියන් වන උෂානි වීරසිංහ හා නිලූකා රත්නවීර යන මහත්ම මහත්මීහු එම වසම්වලට ගොස් වියළි ආහාර මලු බෙදා දීම සිදුකළහ.

(නුවරගල විපුල සිරිවර්ධන)

# කෘෂි රසායන වෙළෙන්ඳන් පාරිභෝගිකයන් ගසාකද්දී රජයේ නිලධාරී මර නින්දේ

(අනුරාධපුර සමන්ත ලීලාරත්න)

**රජය මීට මාස කීපයකට පෙරදී රසායනික පොහොර සහ කෘෂි රසායන වර්ග මින් ඉදිරියට මෙරටට ආනයනය නොකිරීමට තීරණය කිරීමත් සමඟ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බොහෝ කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිකරුවන් ඔවුන් සතු පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය ඉතා ඉහළ මිල ගණන්වලට අලෙවි කරමින් සිටින බව මහකනදරාව ඒකාබද්ධ ගොවි සංවිධානයේ හිටපු සභාපති ආර්.එම්.ආර්. රාජපක්ෂ මහතා පවසයි.**

මේ පිළිබඳව ඉරිද ලංකාදීප රජරටට වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද පැවසීය.

නිලධාරීන් ගොවීන්ට කාබනික පොහොරයි කාබනික තෙලුයි ගහලා වගා කරන්න කිව්වට එහෙම බෑ කියල අත්දැකීමෙන්ම ගොවියෝ දන්නවා. ඒ නිසා පුංචි වගාවක් හරි කරගන්න ගොවියෝ මොනව හරි රසායනික තෙල් පොහොර ටිකක් ගන්න උත්සහ ගන්නවා. ඒකේ වාසිය මේ වෙනකොට තෙල් පොහොර අලෙවි කරන කළුකඩකාරයින්ට ලැබිලා තියෙනවා.

තෙල් පොහොර තහනම් කරන්න කලින් වෙළෙඳ පොළේ කිලෝ 25ක නිල් කැට නමින් හඳුන්වන පොහොර මිටියක් රුපියල් දෙදහත් තුන්දහක් (2000-3000) අතර මිලකට ගොවියාට මිලදී ගන්න පුළුවන් වුණා . මේ වෙනකොට ඒ පොහොර මිටියම අලෙවි කරන්නේ රුපියල් 8000 ත් 9000 අතර මිලකට. වෙළෙඳපොළේ අලෙවි කළ පොහොර කිලෝවක මිල කලින් මිලට සාපේක්ෂව සීයට 300 ත් 400 ත් අතර මුදලකින් ඉහළ ගිහින්.

මීට කලින් කෘමිනාශක, වල්නාශක, දිලීරනාශක මිලදී ගන්න කොට ගොවියට සියයට 10 සිට සියයට 40 දක්වා වට්ටමක් ලැබුණා. නමුත් අද වෙනකොට ඒ කිසිම වට්ටමක් ලැබෙන්නේ නැහැ. ගිය කන්නේ රුපියල් පන්සීයට ගත්ත තෙල් බෝතලේ මේ වෙනකොට රුපියල් 1000 සිට 1500 අතර මිල ගණන්වලට තමයි වෙළෙඳ පොළේ අලෙවි කරන්නේ.

නමුත් ඒ තෙල් ගැහැව්වත් කිසිම ප්‍රතිඵලයක් නැහැ. වල් නාශක, කෘමිනාශක ගන්න කොට සමහර කඩකාරයෝ හොර අරක්කු බෝතලයක් ගංජා පැකට් එකක් දෙනවා වාගේ හොරාට තමයි ගොවියට ඒක දෙන්නේ. ඒ වෙලා සල්ලි ගන්නවා. ගෙදර ගෙනත් බැලුවාම එකේ විකුණුම් මිල හූරලා දෙගුණයක් සල්ලි අරගෙන. ගොවියට ඕනැ හින්ද, වෙන ගන්න තැනක් නැති හින්ද, අසරණකමට කියන්න කෙනෙක් නැති හින්ද පාඩුව විඳ දරාගෙන ඉන්නවා. ගොවියාට මේවා කියන්න කෙනෙක් නැහැ. හොයන්න බලන්න කෙනෙක් නැහැ. ඔහොම තමයි දැන් රට යන්නේ. යැයි ඒ මහතා වැඩිදුරටත් කීය.

**මේ සම්බන්ධයෙන් අප අනුරාධපුර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් චමින්ද ඒකනායක** මහතාගෙන් කළ විමසීමේදී ඒ මහතා කියා සිටියේ මෙවැන්නකි.

### නීතිමය පියවර ගැනීමේ බලය තියෙන්නේ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරියට සහ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරියටයි

**ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් චමින්ද**

රසායනික පොහොර සහ පළිබෝධ නාශක ඉතාම ඉහළ මිල ගණන්වලට වෙළෙඳුන් අලෙවි කරන බව ගොවීන් නිතරම අපට කියනවා. නමුත් මේ පිළිබඳව නීතිමය පියවර ගැනීමට අපට බලයක් නෑ. මේ සම්බන්ධයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ බලය පැවරී තියෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරියට, අන්තර් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරියට සහ උතුරුමැද පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරියටයි. මේ අංශවලට මේ පිළිබඳව අපි දැනුම් දීලා තියෙනවා.

### මට කිසිම බලයක් පැවරිලා නෑ

**දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ තේනුවර**

**මේ සම්බන්ධයෙන් අප අනුරාධපුර දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ එච්.එල්. තේනුවර මහත්මියගෙන් කළ විමසීමේ දී ඒ මහත්මිය කියා සිටියේ මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට තමන්ට බලය පැවරී නැති බවයි.**

### අපටත් කිසිම බලයක් පැවරිලා නෑ

**පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ප්‍රියංගනී**

අනතුරුව උතුරුමැද පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ප්‍රියංගනී මාදන මහත්මියගෙන් කළ විමසීමේදී ද ඇය කියා සිටියේ කෘෂිකර්මික නිෂ්පාදන සහ යෙදවුම්වල මිල පාලනය සම්බන්ධයෙන් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බලයක් නොමැති බවයි.

අනුරාධපුර අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ විමලරත්න මහතා කියා සිටියේ මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට තමන්ට බලයක් නැති බවයි.

### දිගටම වැටලීම් කරනවා ජනතා සහාය ඕනෑ

**පාරිභෝගික අධිකාරියේ නිලධාරී පෙරේරා**

**මේ සම්බන්ධයෙන් අප පාරිභෝගික සේවා අධිකාරියේ අනුරාධපුර කාර්යාලයේ ස්ථාන භාර නිලධාරී එච්.ඩී.පී.ජී. පෙරේරා මහතාගෙන් කළ විමසීමේදී ඒ මහතා කියා සිටියේ මෙවැන්නකි.**

"තෙල්, පොහොර අලෙවියේදී පහුගිය කාලයේ වෙළෙඳුන්ට වට්ටම් ලැබුණා. තෙල් පොහොර තහනමත් සමග මේ වන විට තෙල් පොහොර අලෙවියෙන් වට්ටම් ලැබෙන්නේ නෑ. [illegible] ..." යි ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

## ඩෙංගු මදුරු තවාන් දමන අයට නඩු

**අනුරපුර නගර සභාවේ ප්‍රධාන මහජන පරීක්ෂක ජයම්පති**

(අනුරාධපුර සමන්ත ලීලාරත්න)

අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ඩෙංගු මදුරුවන් බෝවීමට අවකාශ වටපිටාව නිර්මාණය කරන නගරවාසීන්ට, ව්‍යාපාරික ස්ථානවල හිමිකරුවන්ට, ජංගම වෙළෙඳුන්ට මෙන්ම වෙනත් පුද්ගලයන්ට එරෙහිව [illegible] නීතිමය පියවර ගන්නා බව අනුරාධපුර මහ නගර සභාවේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක ජයම්පති බණ්ඩාර මහතා පවසයි.

[illegible]

## කන්තලේ වැව නරබිලිම ගන්නේ ඇයි?

- ඩෙකාන වසංගත රෝගයකටත් සම්බන්ධයි
- අග්බෝ රජුගේ ලේලියකුත් වැවට බිලි දීලා

සෑම වසරකම කන්තලේ වැවට මිනිස් බිල්ලක් අවශ්‍ය බව ගැමියෝ බ්‍රෝහියර්ට කියති. මෙරට මුල්ම ශ්‍රී ලාංකික මිනුම්දෝරුවා වන ආර්.එල්. බ්‍රෝහියර් 1930 දී පමණ කන්තලේ වැව නිරීක්ෂණයට යයි. වසරක් පාසා මිනිස් බිල්ලක් ගැනීමට කන්තලේ වැවට බලපෑ හේතුව ද ප්‍රදේශවාසීහු බ්‍රෝහියර්ට කියති. බ්‍රෝහියර් ලියන ලද 'බ්‍රෝහියර් දුටු ශ්‍රී ලංකාව' කෘතියේ ඒ පිළිබඳව ඔහු මෙලෙස විස්තර කරයි.

දෙවැනි අග්බෝ රජු විසින් කන්තලේ වැව සාදවන ලද බව නිලධාරීන් පිළිගත්ත ද පැරැන්නෝ එය බැහැර කරති. ඔවුන්ගේ ඇදැහිල්ල අනුව මෙම වැව සාදන්නේ ක්‍රිස්තු පූර්ව 2500 දීය. එවකට ඩෙකානය නමැති දේශයේ වසංගත රෝගයක් පැතිරෙයි. ඉන් මිදීමට කරන පූජාවක් ලෙස එරට රජු සිය සිඟිති දියණිය මුහුදට බිළි දෙයි. ඇය නංවන්නේ එක් ලීයෙන් සැදූ සංවෘත නැවකට ය. මේ නැව මුහුදු සුළඟකට හසුව ත්‍රිකුණාමලයට ගොඩගසයි. ජනයා එම ස්ථානයට සිනාසෙන බිළිඳ හෙවත් පත්තිනි යන නම තබයි. ප්‍රාදේශීය රජකු කුමරියව හද වඩා ගනියි. ඔහුගේ ඇවෑමෙන් පසු කුමරිය ප්‍රදේශය පාලනය කරයි.

මේ යුගයේම හින්දු කුමාරයෙක් ඉන්දියාවෙන් ලංකාවට පැමිණ උස් පර්වතයක් මත දේවාලයක් හදයි. පර්වතයේ නම ස්වාමි කන්දයි. ඒ කුමාරයා පලවාහරින්නට කුමරිය සිය හමුද කපිතාන් සහිත භට පිරිසක් සමඟ යයි. කුමාරයා කුමරියව වසඟ කරගෙන පසුව විවාහ කරගන්නට සමත් වෙයි. කුමාරයා විසින් තනමින් තිබෙන දේවාලයේ සිට තඹලගමුව දක්වා ඇති කුඹුරුයාය ද හිමිකර දෙන්නට කුමරිය එකඟවෙයි. ඒ කුඹුරු යාය වගා කිරීමට තරම් ප්‍රමාණවත් ජල සැපයුමක් නොමැති නිසා කන්තලේ වැව බැඳීමට කුමරිය නියෝග කරයි.


ඒ වැව නැවත නිර්මාණය කරන අවස්ථාවේ වැව් බැම්ම සම්පූර්ණ කිරීමට පෙර කොතනකින් හෝ කැඩී යන බව වැඩ අධීක්ෂකවරයා වාර්තා කරයි. එය නැවත නැවතත් සිදුවෙයි. මාස ගණනක් තිස්සේ කම්කරුවන් හෙළන ශ්‍රමය එලෙස වතුරට යාම වළක්වාදෙන්නැයි අධීක්ෂකවරයා කියයි.

වාරි කර්මාන්තය භාර නිලධාරීහු ඊට උපදෙස් ගන්නට අනාවැකි කියන්නකු වෙත යති. වැවේ වැඩ ආරම්භ කරන අවස්ථාවේ ඒ භූමියට අරක්ගත් යක්ෂයාට නිසිලෙස දෙළ පිදේනි දී නොමැති බව නිමිත්තා කියයි. එම යක්ෂයාගේ කෝපය සන්සිඳවීමට නම් කන්‍යා බිල්ලක් ලබාදෙන්නැයි ඔහු කියයි. නර බිල්ලට වාරි කර්මාන්තය භාර ප්‍රධාන නිලධාරියාගේ දරුවකු දෙන්නැයි පාලකයා කියයි. එහෙත් ඔහුට දරුවන් නොවෙයි. ඒ අනුව සිය ඥාති දියණියක බිල්ලට දීමට ප්‍රධානියා තීරණය කරයි.

කම්කරුවෝ එක් සැඳෑවක ඒ කන්‍යාව සරසා ගෙනැවිත් වැව කැඩී යන ස්ථානයේ සිටුවති. ඒ දැක මුළු පරිසරයම ශෝකී පෙනුමකට පත්වෙයි. ප්‍රධානියා ඇයව වසා පස් පුරවන්නට කම්කරුවන්ට අණ කරයි. සැණින් දැරියගේ සිරුරින් අඩක් පස්වලින් වැසීයයි. දියණිය "මාමත් කන්... මාමාත් කන්..." යැයි (මාමේ මගේ ඇස් යනුවෙන්) කෑගසයි. එහි තේරුම ඇගේ ඇස්වලට පස් වැටී ඇති බවයි. කම්කරුවෝ එය නොසලකා පස් දමති. අවසානයේ ඇගේ හිස ද පස්වලින් වැසීයන විට "මාමත් තලෙයි..." කියා ඇය කෑගසයි. තලෙ යනු හිස ය. මාමා නිසලව බලා සිටියි. කම්කරුවෝ පස්වලින් දැරියව වසා දමා වැවේ වැඩ අවසන් කරති. ඇය කෑගැසූ වචනවලින් කන්තලේ යන නම හැදෙයි. වැකන්දේ ඒ කොටසට ජනතාව "කාන්තාවගේ බැම්ම" යැයි කියති.

වැවට අරක්ගත් යක්ෂයා ඒ කන්‍යා නර බිල්ලෙන් ද තෘප්තිමත් නොවෙයි. සෑම වසරකම වැව පිරුණු විට යක්ෂයා පුද්ගලයකු බිල්ලට ගනී. ඒ වග බ්‍රෝහියර්ට කරුණු දැක්වූ අය උදහරණ සහිතව කියති. තවත් සමහරු කියන්නේ මෙම වැව බඳවන දෙවන අග්බෝ රජුගේ ලේලියක මෙලෙස බිල්ලට දුන් බවකි.

තවත් අය කන්තලේ වැව හා සම්බන්ධ හොල්මන් කතා බ්‍රෝහියර්ට කියාදෙති. ඔහු වැවේ ඓතිහාසික ප්‍රබන්ධ, පැරැන්නන්ගේ විස්මිත වාරි තාක්ෂණය හා භූගෝලීය වටපිටාව අධ්‍යයනය කරගෙන ත්‍රිකුණාමලය දෙසට ඇති එහි තානායමේ සිට වැවේ අසිරිය විඳියි.



**අතීතයෙන් සිද්ධියක්-13**

**අනුරාධපුර - සරත් මනුල වික්‍රම**

### දහයියාගම අතුරු පාරක වෙළෙඳසල් ඉදිකිරීමේ නඩුව:

## නොවැම්බර් 24 ද විරෝධතා ගොනු කරන ලෙස නගරාධිපති ඇතුළු වගඋත්තරකරුවන්ට නියෝග

**විරෝධතා ගොනු කිරීමට මසක කාලයක් ලබාදෙන්නැයි පළාත් සභාවේ සහ නගර සභාවේ නීති නිලධාරිනියෝ අධිකරණයෙන් ඉල්ලති**

(අනුරාධපුර අධිකරණ උපාලි ආනන්ද)

**අනුරාධපුර දහයියාගම කාර්මික පෙදෙසට අයත් පොදු අතුරු මාර්ගයකට අවහිර වන අයුරින් ඒ මාර්ගයේ පසෙක වෙළෙඳසල් ඉදිකිරීමට සිය දේශපාලන හිතවතුන්ට නීති විරෝධීව අවසර ලබා දී ඇති බවට චෝදනා කරමින් මහාධිකරණය හමුවේ පවරා ඇති නඩුවට අදළව විරෝධාත ඇත්නම් ලබන නොවැම්බර් 24 වැනිද ගොනු කරන ලෙස උතුරු මැද පළාත් බද මහාධිකරණ විනිසුරු මනෝජ් තල්ගොඩපිටිය මහතා අනුරාධපුර නගරාධිපතිවරයා ඇතුළු වගඋත්තරකරුවන්ට නියෝග කරයි.**

මෙම නඩුවට අදළව විරෝධතා ගොනු කිරීමට මාසයක කාලයක් ලබා දෙන ලෙසට වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටි උතුරු මැද පළාත් සභාවේ නීති නිලධාරිනියන් වන ප්‍රිති මුණසිංහ සහ විශාක සෙනවිරත්න සහ අනුරාධපුර මහ නගර සභාවේ නීති නිලධාරිනි ප්‍රියන්ති නිශ්ශංක යන මහත්මීන් අධිකරණයෙන් කළ ඉල්ලීමක් සලකා බලමින් විරෝධතා ගොනු කිරීමට මෙලෙස මසක කාලයක් ලබා දුන්නේය.

එමෙන්ම මෙම ප්‍රශ්න ගත අතුරු මාර්ගය තුළ හෝ ඒ දෙපස කිසිදු ඉදිකිරීමක් නොකරන ලෙසට නියෝග කරමින් අනුරාධපුර නගරාධිපතිවරයාට සහ නාගරික කොමසාරිස්වරයාට එරෙහිව පනවා තිබූ අතුරු තහනම් නියෝගය ද එදින දක්වා තවදුරටත් දීර්ඝ කිරීමටද මහාධිකරණ විනිසුරුවරයා නියෝග කරනු කළේය.

අනුරාධපුර අපි අවදියෙන් සංවිධානයේ සංවිධායක අමල් පියතිලක මහතා නීතිඥ අනුරුද්ධ විජේරත්න මහතා මගින් අනුරාධපුර මහාධිකරණය හමුවේ පවරා ඇති මෙම නඩුවේ වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත්තේ අනුරාධපුර නගරාධිපති එච්. පී. සෝමදාස, නාගරික කොමසාරිස් රුවන් විජේසිංහ, උතුරු මැද පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂිකා ප්‍රියංජනී මාදන, උතුරු මැද පළාත් පාලන කොමසාරිස් රෝයි නිශාන්ත, උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි බංඩාර සහ උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් යන මහත්ම මහත්මීන්ය

දේශපාලන අරමුණු වෙනුවෙන් පොදු ජන දේපල කොල්ල කෑමට ඉඩදීම වළක්වා ගැනීම සඳහා අධිකරණ බලය මෙහෙයවා ගැනීමේ අරමුනින් මෙම පෙත්සම මහාධිකරණයට ඉදිරිපත් කළ බව නීතිඥ අනුරුද්ධ විජේරත්න මහතා පෙත්සම්කාර අමල් පියතිලක මහතා වෙනුවෙන් කරුණු දක්වමින් මීට පෙර විවෘත අධිකරණයේදී පැවසීය

මෙම සිද්ධියේදී පළමු වගඋත්තරකාර නගරාධිපතිවරයා සහ දෙවැනි වගඋත්තරකාර නාගරික කොමසාරිස්වරයා ස්වකීය තනතුරු වලට අදළ ව්‍යාවස්ථාපිත බලය අභිබවා යමින් අනීතිකව ක්‍රියා කර ඇති බවටද නීතිඥවරයා චෝදනා කළේය.

## පාසල් ළමයින් ප්‍රවාහනය කරන බස්වල ගාස්තු වැඩි කරන්නේ නෑ

**පාසල් ළමයින් ප්‍රවාහන සේවා සංගමය කියයි**

(තඹුත්තේගම සමන් දිසානායක)

**කොරෝනා හේතුවෙන් ජනතාවගේ ආදයම් මාර්ග ඇහිරී ගොස් ඇති නිසා පාසල් ආරම්භ වීමත් සමග අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් ළමයින් ප්‍රවාහනය කිරීමේදී තම සංගමයේ බස් රථ හිමියන් කිසිදු මුදලක් වැඩි නොකරන බව සමස්ත ලංකා අන්තර් දිස්ත්‍රික් පාසල් ළමයින් ප්‍රවාහන සේවා සංගමයේ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් ඉන්දික ප්‍රසාද් කුමාර මහතා කියයි.**

ඉරිද ලංකාදීප රජරටට අදහස් දක්වමින් ඒ බව කී ඉන්දික මහතා, වැඩිදුරටත් මෙසේ ද කීවේය.

"අපි සේවා සපයන්නේ, ගනුදෙනු කරන්නේ දුෂ්කර ගම්මානවල දරුවන් එක්ක. මේ දරුවන්ගේ දෙමාපියන් සල්ලිකාරයන් නෙවෙයි. නමුත් දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදෙන්න ඕනෑ නිසා නොකා නොබී හරි දරුවන් පාසලට යවනවා. අපි මේ අවස්ථාවේදී මුදලට වඩා සේවාව ගැනයි බලන්නේ. අපේ බස් රථ වසර එක හමාරක කාලයක ඉඳලා ධාවනය කළේ නැහැ. මේ නිසා ගොඩාක් අමතර කොටස් අලුතෙන් දාන්න වෙනවා. ලක්ෂයක විතර මුදලක් වැය කරන්න වෙනවා බස් රථයක් එළියට දද්දි. නමුත් එහෙම කියලා අසරණ වෙලා ඉන්න මාපියන්ගෙන් අපිට වැඩි මුදලක් අය කරන්න බැහැ. එහෙම කළොත් එද වේල කන්න නැතිව ඉන්න මිනිස්සු තවත් අසරණ වෙනවා.

අපේ සංගමයේ සාමාජිකයන්ට අයත් බස් රථ 650ක් අනුරාධපුර දිස්ත්‍රික්කය පුරා ධාවනය කළා. නමුත් අලුතෙන් පාසල් ආරම්භ කිරීමත් සමග කීයක් ධාවනය කරයි ද කියන්න බැහැ. මොකද ඒ තරමටම අපේ පාසල් බස් රථ හිමියනුත් ආර්ථික වශයෙන් ගොඩාක් පහළට ගිහින් ඉන්නේ. මේ අයට බස් රථයක් පාරට දාන්න තරම් වැය කරන්න වත්කමකුත් නැහැ. නමුත් ධාවනය කරන බස් රථ වුණත් අපි එකම තීරණයක ඉන්නවා මුදල් වැඩි කරන්නේ නැහැ කියලා.

අපි සියලු දෙනා මනුස්සයෝ. අහිංසක මිනිසුන්ට කන්නවත් නැතිව ඉන්න වෙලාවේ අපි, අපි ගැන විතරක් හිතන්න නරකයි. දරුවන් පාසල් යවන්න ඉන්න මව්පියන්ට ඒ දරුවන්ට සපත්තු, ඇඳුම් හා පොත්පත් අලුතෙන් ගන්න වෙනවා. ආදයම් මාර්ග අහිමි වුණු මව්පියන්ට මේ දේවල්වත් අරන් දෙන්න වත්කමක් නැහැ. එවැනි මොහොතක ළමයි ප්‍රවාහනය කරන බස් රථවලිනුත් මිල ගණන් වැඩි කළා කීවොත් මොනවා හිතෙයි ද? ඒ අසරණ මිනිසුන්ගෙන් ලබාගන්නා මුදලින් අපේ පවුල්වල අඩුපාඩු විතරක් සම්පූර්ණ කරගෙන වැඩක් නැහැ. මේ කොරෝනා ව්‍යසනය අපි කාටත් හොඳ පාඩම් කියා දුන්නා. ඒ නිසා මේ අවස්ථාවේදී අපි සියලු දෙනා එක එක්කෙනාට උදව් කරගත යුතුයි." යැයි ද ඉන්දික ප්‍රසාද් කුමාර මහතා වැඩිදුරටත් කීවේය.

# මල්වතු ඔය ජලාශයෙන් යන එන මං නැතිවන




මාධ්‍ය හමුව

# තන්තිරිමලේ ජනතා දුක

**හදන්න හදන්නේ කලාවැව වගේ දෙගුණයක් විශාල ජලාශයක්**

**ජලාශය හැදුවොත් පවුල් දහස් ගණනකට උන්හිටි තැන් පවා අහිමි වෙනවා**

**ජලාශයට යටවෙන්නේ අක්කර හයදාහක් කියලයි බලධාරීන් කියන්නේ**

**දෙනවා කියපු කිසිවක් තවමත් දුන්නේ නෑ**

**අක්කර 16000-17000 ක් විතර යටවෙන බවයි අපට පෙන්නේ**

**අවතැන් වන අයට දෙන්නේ විල්පත්තුවේ ගල් ගොඩවල් සහිත ඉඩම්**

**සිද්ධවෙන අසාධාරණය ගැන ජනපතිවරු තුන් දෙනෙකුට කිව්වා**

**ප්‍රදේශය යටවෙන නිසා දිනකට කිරි ලීටර් 4000 ක නිෂ්පාදනය නැතිවෙනවා**

**පහළ මල්වතු ඔය ජලාශයේ ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ජලාශය ඉදිකිරීම නිසා අවතැන් වන තන්තිරිමලය ප්‍රදේශයේ ජනතාවට සහන රැසක් ලබා දෙන බවට නිලධාරීන් සහ දේශපාලනඥයින් පොරොන්දු වුවත් ඉදිකිරීම ආරම්භ කර මාස පහක පමණ කාලයක් ඉක්මවා ගොස් තිබුණ ද ලබාදුන් පොරොන්දු කිසිවක් මේ දක්වා ඉටුකර නැතැයි ජලාශය ඉදිකිරීමෙන් අවතැන් වන තන්තිරිමලය ප්‍රදේශයේ ජනතාව පවසයි.**

පසුගියද තන්තිරිමලය බිල්ලෑව රජ්ජකිබ්‍රහණ් ප්‍රජාශාලාවේ දී පැවැති මාධ්‍ය හමුවේදී ජනතාව මේ බව පැවසූහ.

මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතියෙන් අවතැන් වූ තන්තිරිමලය ජනතාවගේ ගොවි සංවිධාන එකමුතුව විසින් මෙම මාධ්‍ය හමුව සංවිධානය කර තිබුණි.

රට තුළ පවතින වසංගත තත්ත්වය හේතුවෙන් එක් ගම්මානයකින් නියෝජිතයින් දෙදෙනකු පමණක් මේ අවස්ථාවට සහභාගී කර ගත් බව සංවිධායකයෝ පැවසූහ. ජලාශය ඉදිකිරීම නිසා ප්‍රදේශය තුළ උද්ගත වන තත්ත්වය මෙන්ම අනාගතයේ ඇතිවන තත්ත්වය සහ ඒ වෙනුවෙන් ජනතාවට ඇතිවන හානිය පිළිබඳව ජනතාව දැක්වූ අදහස් මෙලෙස පෙළගස්වමු.

**පහළ මල්වතුඔය ජලාශ ව්‍යාපෘතියෙන් අවතැන් වූ තන්තිරිමලය ජනතාවගේ ගොවි සංවිධාන එකමුතුවේ කැඳවුම්කරු එන්. අමරසිංහ මහතා.**

මල්වතු ඔය හරස් කරලා තන්තිරිමලය ප්‍රදේශයේ පහළ මල්වතු ඔය ජලාශය ඉදිකරන බවට මුලින්ම කතිකාවතක් ඇරඹුණේ මීට වසර 6- 7 කට පෙරයි. කලාවැව මෙන් විශාලත්වයෙන් දෙගුණයක් වන ජලාශයක් මේ ප්‍රදේශය තුළ ඉදිකරන බව මුලින් ප්‍රකාශ වුණා. මේ ජලාශය ඉදිකිරීම නිසා මේ ප්‍රදේශයේ පවුල් දහස් ගණනකට උන්හිටි තැන් අහිමි වෙන නිසාත් ඒ තුළින් විශාල පාරිසරික සමාජ ගැටලු රැසක් නිර්මාණය වන නිසාත් ඓතිහාසික සංස්කෘතික මෙන්ම ආගමික වශයෙනුත් විශාල හානියක් වන නිසාත් මේ ප්‍රදේශයේ සියලුම දෙනා මේ ජලාශ ව්‍යාපෘතියට තදින්ම විරුද්ධ වුණා. බලධාරීන් සමග කළ සාකච්ඡාවලින් ප්‍රතිඵලයක් නැති වෙනකොට මිනිස්සු පාරට බැහැලා විරෝධය දැක්වූවා. එහි ප්‍රතිඵලයක් විදිහට ජලාශය නිසා උන්හිටිතැන් අහිමි වන අයට ප්‍රතිලාභ රැසක් ලබා දෙන්න බලධාරීන් ජනතාවට පොරොන්දු වුණා.

ගේදොර, කුඹුරු, වගා බිම් අහිමි වන අයට ඉඩම්වලින් හානිවෙන්නේ මුලින් වන්දි ලබාදෙන බවට මුලින් පොරොන්දු වුණා. ජලාශ ව්‍යාපෘතියට සඳහා අවශ්‍ය ශ්‍රමිකයන් මේ ප්‍රදේශයෙන් බඳවා ගන්නා බවට පොරොන්දු වුණා. ව්‍යාපෘතියේ උනිත් රැකියාවන් සඳහා ද ප්‍රදේශයේ අයට මුල් තැන දෙන බව කිව්වා. ඉදිකිරීම සඳහා මේ ප්‍රදේශයේ ට්‍රැක්ටර් සහ ලොරි රථ යොදා ගන්නා බව කිව්වා. ජලාශයේ ඉදිකිරීම පටන් ගත්තේ අවතැන් වන ජනතාව වෙනත් සුදුසු තැනක පදිංචි කිරීමෙන් අනතුරුව බව ප්‍රකාශ කළා. විනාශවන ගහකොළවලට වගාබිම්වලට ඉදිකිරීම්වලට වන්දි ලබාදෙන බව කිව්වා. නමුත් අද වෙන විට මේ කිසිම පොරොන්දුවක් ඉටු වෙලා නෑ. නිලධාරීන් දේශපාලනඥයින් ජලාශය ඉදිකිරීම නිතුවක්කාර ලෙස කරගෙන යනවා. අඩුම තරමේ අපිට ඒ අය සාකච්ඡාවක්වත් ලබා දෙන්නේ නෑ.

රටේ සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක වෙනකොට ඒ වැඩසටහන ක්‍රියාත්මක වෙන ප්‍රදේශයේ ජනතාවට යම් කැපකිරීමක් කරන්න වෙනවා. මහවැලි ව්‍යාපාරය ආරම්භ වෙනකොට කන්ද උඩරට මිනිස්සු දහස් ගණන් ඒ පරිත්‍යාගය කළා. ඒ වගේ අපේ තන්තිරිමලය ප්‍රදේශයේ ජනතාවත් රටේ සංවර්ධනයට අකුල් හෙළන්නේ නැහැ. මේ ජලාශයෙන් රටට යහපතක් වෙනවා නම් මේ ප්‍රදේශයේ ජනතාව අවුරුදු හැට හැත්තෑවක් තුළ හොයාගත්ත දේවල් කැප කරන්න ලැහැස්තියි. නමුත් ඒ වෙනුවෙන් මේ ජනතාවටත් සාධාරණයක් වෙන්න ඕනෑ. අපේ ඉල්ලීම වන්නේ ඒක තමයි.



සහභාගිවූ පිරිස

ජලාශයට යට වන බිම් ප්‍රමාණය, විනාශ වෙන නිවාස ප්‍රමාණය, වගා බිම් ප්‍රමාණය, කුඹුරු ප්‍රමාණය පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන දත්ත පිළිබඳව අපට සෑහීමකට පත්වෙන්න බෑ. මොකද දෙපාර්තමේන්තුව දක්වන්නේ ඉතාම සුළු දත්ත ප්‍රමාණයක් විතරයි. මුල් අවස්ථාවේ ජලාශය ඉදිකිරීම් ආරම්භ කරන්න ලැහැස්ති වෙනකොට වාරිමාර්ග දෙපාර්තමේන්තුව කිව්වේ පවුල් තුන්සිය හැටක් මේ ව්‍යාපෘතියෙන් අවතැන් වෙනවා කියලයි. නමුත් දෙවන වතාවේ මුල්ගල තියලා ඉදිකිරීම් ආරම්භ කරනකොට මේ අයම කිව්වේ පවුල් දෙසිය හතරක් අවතැන් වන බවයි. මුලින් ඒ අයම කියපු පවුල් 360 පවුල් 204 දක්වා අඩු වුණේ කොහොමද කියන එක තමයි අපට දැන් තියෙන ප්‍රශ්නය. ඒ අය කියන විදියට අක්කර හයදහක් විතර බිමක් තමයි ජලාශයට යට වෙන්නේ. ජලාශයට යට වෙන වැව් ගණන දහතක් කියලයි ඔවුන් කියන්නේ. නමුත් අපි හඳුනාගෙන තියෙන විදිහට මේ ජලාශය ඉදි කළාම වැව් 24 ක් යට වෙනවා. පවුල් දෙදහකට විතර නිවාස අහිමි වෙනවා.

**විශේෂ ව්‍යාපෘතියකින් කෙරෙන නිසා මට මේ ගැන වගකීමක් නෑ**

**අනුරපුර කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ සුසන්ත දර්ශන මැදිවක**

කුඹුරු ඉඩම් අක්කර 4000 ක් විතර යටවෙනවා. සම්පූර්ණයෙන් අක්කර පහළොස් දහක් දහත්දහක් විතර බිමක් යට වෙනවා කියලා තමයි අපි දන්නේ. කොහොම වුණත් කමක් නෑ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් මේ ජනතාව ඔවුන් ජීවිත කාලය පුරාම හරි හම්බ කර ගත්තු මේ දේවල් කැප කරන්න ලැහැස්තියි. මේ වාගේ කැප කිරීම් මුල්වරට කරන්නේ තන්තිරිමලේ ජනතාව නොවෙයි. ලංකාවේ ජනතාව අවස්ථා විශාල ප්‍රමාණයක් මෙවැනි කැපකිරීම් කරලා තියෙනවා. හැබැයි ඒ සෑම අවස්ථාවකම ඒ කැපවීම කළ අයට තමයි ඒ ව්‍යාපෘතිවලින් මුලින්ම ප්‍රතිලාභ ලැබුණේ. නමුත් අවාසනාවකට මේ ජලාශයෙන් තන්තිරිමලේ ජනතාවට උන්හිටි තැන් අහිමි වෙනවා මිසක් ජලාශයෙන් කිසිම ප්‍රතිලාභයක් ලැබෙන බවට පෙනෙන්නේ නැහැ.

දිස්ත්‍රික්ක දෙකක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරක තුලාන් නමයක බිම්කඩක් මේ ජලාශයට යට වෙනවා. මේ ජලාශය ඉදි කළා ම ජලාශයට ඉඩකඩම් අහිමි වෙන ජනතාවට ජලාශය යටතේ කිසිදු ඉඩමක් ලැබෙන්නේ නැහැ. අවතැන් වන අයට ලබාදීමට සැලසුම් කරලා තියෙන්නේ කිසිදු ප්‍රයෝජනයක් ගැනීමට නොහැකි ගල් ගොඩවල් තියෙන විල්පත්තු සීමාවේ තියෙන ඉඩමක්. මහ කන්නයට විතරක් උස්සාන ක්‍රමයට අක්කර හත්සියයක් වගා කරන්න වතුර දෙනවා කියනවා. නමුත් ඒකත් කෙරෙයිද දන්නේ නෑ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව කියන්නේ මන්නාරමේ යෝධ වැව සහ අකිතමුරුප්පුව වැව යටතේ දැනට මහ කන්නයට විතරක් වගා කරන අක්කර තිස්දහකට යල මහ වගා කරන්න ජලය දෙන්න මේ ජලාශය ඉදිකරන බවයි. මේ ජලාශය නිසා අපේ අක්කර 4000 කුඹුරු ඉඩම් යට වෙනවා. නමුත් අපිට මේ යටතේ ඉඩම් අක්කරයක්වත් ලැබෙන්නේ නැහැ. උස්සාන වැඩසටහන ක්‍රියාත්මක වුණොත් විතරක් අක්කර හත්සියයක් මහ කන්නයට විතරක් වගා කරන්න හැකි වෙනවා.

අපිට වන මේ අසාධාරණය ගැන මේ ප්‍රදේශයේ මිනිස්සු ජනාධිපතිවරු තුන්දෙනෙකුට දුක කිව්වා. වර්තමාන ජනාධිපතිතුමාගෙන් අපි ඉල්ලන්නේ මේ ජලාශය නිසා අවතැන් වන මිනිසුන්ට යම් සහනයක් ලබාදෙන්න කියලයි.

**තන්තිරිමලය සඳුන්ගම ඩබ්ලිව්.ජී.එස්. කුලතුංග මහතා.**

තන්තිරිමලේ ප්‍රදේශය කියන්නේ මේ රටේ කෘෂි ආර්ථිකයට ලොකු දායකත්වයක් සපයන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ මිනිස්සු හරිම ශක්ති සම්පන්නයි. සමහර ගොවීන් අක්කර 10-15 වගේ විශාල ඉඩම්වල උඳු, කුරක්කන්, තල, එළවළු, පලතුරු වගා කරනවා. ඔවුන් මේ රටේ නිෂ්පාදනයට නිහඬව විශාල දායකත්වයක් සපයනවා. මේ ජලාශය ඉදිකිරීම නිසා මේ සියලු වගාවන් ඉදිරියේදී ඇනහිටිනවා. ඒ වගේම මේ ප්‍රදේශයෙන් දෛනිකව කිරි ලීටර් හාරදහක් පමණ නිෂ්පාදනය කරනවා. ඉදිරියේදී ජලාශය නිසා සතුන්ට වෙන්වුණු ඉඩම් යටවීම නිසා ප්‍රදේශයේ සත්ව පාලන කටයුතු සම්පූර්ණයෙන්ම ඇනහිටිනවා.

**අවතැන් ජනතාවට දෙන ඉඩම්වල මැනුම් කටයුතු කරගෙන යනවා**

**ව්‍යාපෘති බාර අධ්‍යක්ෂ සනත් ගුණසේන**

**ඩී.ආර්. ලියනාරච්චි මහතා.** තන්තිරිමලය වල් බිහි වෙලා තිබුණු කාලයේ මිනිස්සු මේ ප්‍රදේශයට ඇවිදින් බොහොම දුකසේ හේන් වගා කරගෙන ජීවත් වුණා. දැඩිය මහන්සියෙන් කට්ටි කපල වැව් බැඳගත්තා. වන සතුන් එක්ක දශක ගණනාවක් ම මේ මිනිස්සු අපා දුක් විඳිනවා. තවත් කාලයක් යන්න එන්න හරි හමන් පාරක් තොටක් නැතුව මේ මිනිස්සු බොහොම අසරණ වුණා. තිස් අවුරුද්දක් පුරා රටේ යුද්ධයක් තිබුණු කාලයේ තන්තිරිමලය ජනතාව නොවිඳිනා දුක් වින්ද. හරිහමන් කෑමක් නැතුව රෑ තිස්සෙ මර බයේ වනාන්තරවලට වෙලා මදුරුවෝ කකා ජීවිතය රැකගන්න දුක් වින්ද. අවුරුදු හතළිහක් පනහක් එහෙම දුක් විඳපු තන්තිරිමලේ මිනිස්සුන්ට මේ කාලයේ තමයි යම් සැනසීමක් ඇති වුණේ. එහෙම ඉන්නකොට තමයි මේ ජලාශ ව්‍යාපෘතිය ඇවිදින් ආයෙත් අපි මහ පාරට වැටෙන තැනට පත් වෙලා තියෙන්නේ. අවුරුදු ගණනක් මේ මිනිස්සු එහෙම දුක් විඳින කොට කිසිම දේශපාලනඥයෙක් නිලධාරියෙක් මේ අය දිහා හැරිලාවත් බැලුවේ නෑ. බැලූ බැල්මට මේ තරම් ලොකු ජලාශයක් තන්තිරිමලය ඉදිකළාට මෙයින් වෙන යහපතට වඩා වන හානිය විශාලයි. නමුත් අපේ බලයට වැඩිය දේශපාලඥයෝගෙයි, නිලධාරීන්ගෙයි සමාජයේ අනිත් ගරු කටයුතු අයගෙයි බලය වැඩි වුණා. කමක් නෑ. අපි මේ ජලාශ ව්‍යාපෘතියට අකුල් හෙළන්නේ නෑ.

තන්තිරිමලය සංවර්ධනය කරන්න ඕන නං මහවැලි වතුර ගෙනත් මේ ප්‍රදේශයේ කුඩා වැව් සියල්ලම පෝෂණය කරලා යල මහ වගා කරලා මේ ප්‍රදේශය සරුසාර කරන්න පුළුවන්. නමුත් එහෙම කරන්න කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නෑ. මේ ව්‍යාපෘතිය හරහා ලොකු කොමිස් මුදලක් කඩා වඩාගෙන තමන්ගේ මඩිය පුරවා ගන්න තමයි දේශපාලඥයින්, නිලධාරීන් සහ සමාජයේ ගරු කටයුතු කියන තවත් කිහිප දෙනෙක් මේ උත්සාහ කරන්නේ. මුදලට යටවෙලා ඉන්න අයට අපේ දුක කිව්වට වැඩක් නෑ. ආරංචි වෙලා තියන විදියට මේ වෙනකොට ප්‍රදේශයේ කිහිප දෙනෙක් ගල්කොරි දහතුනක් පටන් ගන්න දැනටමත් ඉල්ලුම් කරලා තියෙනවා. සංචාරක හෝටල් හදන්නත් එහෙමයි. මේ ව්‍යාපෘතියේ වැඩ කරන හැම ටිපර් එකකින්මයි වැඩ කරන කම්කරුවෙකුගෙන්මයි කිහිපදෙනකුට කොමිස් එකක් යනවා කියලා දැනගන්න තියෙනවා. පස්සේ කාලේ ඒ ගැන හරි තොරතුරු හොයාගෙන අපි මාධ්‍යයට ඒවා ඉදිරිපත් කරන්නම්. වැලි ව්‍යාපෘති පටන් ගන්නත් තව කිහිප දෙනෙක් පොරකමින් ඉන්නව කියල තමයි ආරංචිය තියෙන්නේ. තන්තිරිමලේ ජනතාවට යන එනමං නැති වෙලා ඉන්න වෙලාවක කිහිප දෙනෙකුට විතරක් මේ ව්‍යාපෘතිය ධන උල්පතක් වෙලා.

**ඩබ්ලිව්.එම්. පොඩිනෝනා:** අවුරුදු දෙකක ඉඳලා අපේ රටේ ලොකු ව්‍යසනයක් තියෙනවා. රටම අක්‍රීය වෙලා තිබුණත් තන්තිරිමලේ ජනතාවට ආහාරවලින් ලොකු අහේනියකින් නෑ. මේ ජනතාව මහ පොළොව සමඟ පොර බදලා යමක් කමක් හම්බ කරගෙන ජීවත් වෙනවා. ඒ හින්ද තන්තිරිමලේ ජනතාව රටට ණය නැහැ. නමුත් මේ ජලාශය නිසා තන්තිරිමලය ජනතාවගේ ඉඩම් ජලාශයට යට වෙනවා. දැනට දැනගන්න තියෙන විදිහට අවතැන් වන පවුලකට ලැබෙන්නේ අක්කරයක විතර පුංචි ඉඩමක් පමණයි. මේ පුංචි ඉඩම හම්බුනොත් මේ ජනතාවට ඉදිරියට නැවත වගා කටයුතු කරගන්න ලැබෙන්නේ නැහැ. ඉන්න සත්තු ටික නඩත්තු කරගෙන යන්න වෙන්නේ නැහැ. ඒ හින්ද අපේ ඉල්ලීම වෙන්නේ අවතැන් වෙන අයට අඩුම වශයෙන් අක්කර දෙක තුනකවත් ඉඩමක් ලබා දෙන්න කියලයි. ඊට අමතරව හානිවන නිවාසවල වටිනාකමට වන්දි මුදලක් මෙන්ම ගහ කොළවලටත් වන්දි මුදලක් දෙන්න කියන ඉල්ලීම තමයි අපිට කරන්න තියෙන්නේ.

මේ සම්බන්ධයෙන් අප අනුරාධපුර කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ සුසන්ත දර්ශන මැදිවක මහතාගෙන් කළ විමසීමේදී ඒ මහතා කියා සිටියේ මෙම කටයුතු විශේෂ ව්‍යාපෘතියක් හරහා සිදුවන බැවින් තමාට මේ සම්බන්ධයෙන් වගකීමක් පැවරී නැති බවයි.

**ජලාශය ඉදිකිරීම නිසා අවතැන් වන තන්තිරිමලය ප්‍රදේශයේ ජනතාව නගන චෝදනාව සම්බන්ධයෙන් අප පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපාතිය බාර අධ්‍යක්ෂ සනත් ගුණසේන මහතාගෙන් කළ විමසීමේදී ඒ මහතා ලබා දුන්නේ මෙවැනි පිළිතුරකි.**

ජලාශය ඉදිකිරීම නිසා අවතැන් වන ජනතාව පදිංචි කිරීමට අවශ්‍ය ඉඩම්වල මැනුම් කටයුතු කරගෙන යෑමට මේ වන විටත් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට බාර දීලයි තියෙන්නේ. එම කටයුතු අවසන් වෙන්න තව මාස දෙක තුනක කාලයක් ගතවෙනවා. ජලාශයට යටවන නිවාසවල සහ ඉඩම්වල වටිනාකම තක්සේරු කිරීම් කිරීමට අවශ්‍ය ගැසට් නිවේදනය තවත් මාසයක් දෙකකින් නිකුත් වෙනවා. එහෙම වුණහම ලබන වසරේ මුල් කාලය වන විට නැවත පදිංචි කිරීම් කටයුතු ආරම්භ කරන්න පුළුවන්.

**මේ සම්බන්ධයෙන් අප කළ විමසීමට පිළිතුරු දුන් මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් මංජරී සී. චන්ද්‍රදාස මහත්මිය කියා සිටියේ මෙවැන්නකි.**

ජලාශය ඉදිකරන්න පෙර අවතැන් වන අයට නිවසක් ඉඩමක් ලබාදෙන බව ප්‍රකාශ වුණත් මේ වෙන විට එය වෙනස් වෙලා තිබෙනවා. නමුත් ජලාශ ඉදිකිරීම නිසා අවතැන් වන ජනතාවට කිසිදු ආකාරයකින් අසාධාරණයක් වෙන්න ඉඩ තියන්නේ නැහැ. හැම කෙනාටම ඉඩමක් නිවසක් ලබා දෙනවා. 2016 තමයි මේ ප්‍රදේශයේ අවතැන් වන අය පිළිබඳ සමීක්ෂණයක් කළේ. නමුත් මම යෝජනා කරලා තියෙනවා වර්තමානයේ දී නැවත අවතැන් වන ජනතාව පිළිබඳව සමීක්ෂණයක් කරන්න කියලා. මොකද 2016 පස්සේ අනූ පවුල් කිහිපයක්ම මේ ප්‍රදේශය තුළ පදිංචි වෙලා ඉන්නවා. කළුවිල හා නාරංවිල කියන ප්‍රදේශ තමයි අපි නැවත පදිංචි කරන්න තෝරගෙන තියෙන්නේ. නමුත් ජනතාව හිඟුරුකැන්න ප්‍රදේශයේ පදිංචි කරන්න කියලා ඉල්ලනවා. ඒ නිසා අපි ඒ ගැනත් අවධානය යොමුකරලා නැවත පදිංචි කරන කටයුතු කරගෙන යන්න බලාපොරොත්තු වෙනවා. නැවත පදිංචි කරන හැම ගම්මානයකටම පොදු යටිතල පහසුකම් ලබා දීමටත් පියවර ගන්නවා.

**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සභාපති පී.බී.එන්. ජයසුන්දර මහතාගෙන් අප කළ විමසීමේදී ලබා දුන්නේ මෙවැනි පිළිතුරකි.**

ජලාශය ඉදිකිරීම නිසා අවතැන් වන ජනතාවට යම් අසාධාරණයක් වෙයි කියලා ලොකු බියකින් තමයි ජනතාව ඉන්නේ. අපි දිස්ත්‍රික්කයේ දේශපාලන නායකයින් හා නිලධාරීන් සමග මේ සම්බන්ධයෙන් දිගින් දිගටම සාකච්ඡා කරලා තිබෙනවා. ඒ හැම කෙනාටම මේ ප්‍රදේශයේ ජනතාවට අසාධාරණයක් නොවන ආකාරයට කටයුතු කරන බව තමයි අපිට කියලා තියෙන්නේ ඒ නිසා අවතැන් වන ජනතාව අනිසි බියක් ඇති කර ගන්න අවශ්‍ය නැහැ.යනුවෙන් ඒ මහතා වැඩිදුරටත් පැවසීය.



ඩබ්ලිව්.ජී.එස්. කුලතුංග



එන්. අමරසිංහ



ඩබ්ලිව්.එම්. පොඩිනෝනා



ඩී. ආර්. ලියනාරච්චි

සටහන හා ඡායාරූප
**අනුරාධපුර සමන්ත ලීලාරත්න**

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 නොවැම්බර් මස 14 වැනිදා ඉරිදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.